ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 6 මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I - 2022/2023
LLU6716/LWU4324 – වාණිජ නීතිය
කාලය - පැය 1

දිනය : 2023 සැප්තැම්බර් 25 වේලාව: ප.ව 1.30 - ප.ව 2.30

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. පහත අවස්ථාවන්හිදී පැන නගින නෛතික ගැටලු සාකච්ඡා කරන්න. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් ඔබේ තර්කයන් සනාථ කරන්න.

(අ) ගැණුම්කරුවෙකු ධාන්‍ය 50kg ක් සහ සීනි 20kg ක් විකුණුම්කරුවෙකුගෙන් මිලට ගැනීමට එකග විය. එකී භාණ්ඩ තෙවන පාර්ශවයක් වන සුනිල්ට අයත් ගබඩාවක ගබඩා කර තිබුණි. භාණ්ඩ ගැණුම්කරු වෙත භාර දීමට පෙර ඒවායේ බර මැනීමට ගිවිසුමෙහි කොන්දේසි මගින් නියම කර තිබුණු අතර, විකුණුම්කරු සුනිල්ට උපදෙස් දෙනු ලැබුවේ බර මැනීම සිදු කර එහි ප්‍රතිඵල ගැණුම්කරු වෙත දැනුම් දෙන ලෙසයි. කෙසේ නමුත් අධික වර්ෂාවේ ප්‍රතිඵලයක් ලෙස, ගබඩාවෙහි ගබඩා කර තිබූ සමහර භාණ්ඩ වලට හානි සිදු විය. ඒ අනුව සීනි 20kg හා ධාන්‍ය තොගයෙන් කොටසකගේ තත්ත්වය බාල වී තිබුණි.එහෙයින් ගැණුම්කරු බාල තත්ත්වයෙහි පවතින භාණ්ඩ සඳහා මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කරයි. විකුණුම්කරු කියා සිටින්නේ, භාණ්ඩ වෙන් කර තබන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේම භාණ්ඩවල අයිතිය ගැණුම්කරු වෙත මාරු වී ඇති නිසා තමාට අදාළ ගාස්තුව අවශ්‍ය බවයි.

(ආ) කුමාර් සහ ඔහුගේ පවුල විදේශගත වීමට සැලසුම්කර ඇති අතර ඔවුන්ගේ ආසන හතක් සහිත කැරවන් වර්ගයේ වෑන් රථය රුපියල් මිලියන 7කට නොඅඩු මුදලකට යන කොන්දේසිය ප්‍රකාරව විකිණීමට අවශ්‍යව ඇත. කුමාර් නියෝජිතයෙකු වන සුරේෂ්ට අදාළ වාහනය විකිණීමේ කාර්යය භාර දෙන ලදී. සුරේෂ් ඉහළ යන වෙළඳපොළ ඉල්ලුම සම්බන්ධව සැලකිල්ලෙන් පසු වූ අතර වඩාත්ම හොඳ මිලක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් විකිණීම ප්‍රමාද කිරීමට තීරණය කරන ලදී. රටින් පිටවීමට පෙර සිය වෑන් රථය විකිණීමේ තත්ත්වය පරීක්ෂා කිරීමට කුමාර් තීරණය කළේය. වෑන් රථය විකුණා තිබේදැයි සුරේෂ්ගෙන් විමසූ ඔහු, විකුණා නැත්නම් සුරේෂ්ට එය කුමාර්ගේ මිතුරියක වන ජානකීට භාරදිය හැකිදැයි ඇසුවේය. සුරේෂ් වෑන්රථයක් මිලදී ගැනීමේ කැමැත්ත ප්‍රකාශ කර තිබුණත් ඔහු කුමාර්ගේ වෑන් රථය මිලදී ගැනීමට හෝ කුමාර්ගේ වෑන් රථය ජානකී වෙත ආපසු දීමට පොරොන්දු වී නොතිබුණි. මේ අතරවාරයේ

කුමාර් සහ ඔහුගේ පවුල විදේශගත විය. කුමාර් මාස තුනකට පසු ආපසු පැමිණි විට ඔහු සුරේෂ්ව සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළ නමුත් එය අසාර්ථක විය. මේ නිසා 2023 ජූලි 10 වන දින සුරේෂ් වෙත කුමාර් ලිපියක් යවමින් කියා සිටියේ, 2023 ජූලි 30 වන දින වන විට වෑන් රථය ආපසු භාර නොදුන්නේ නම් සුරේෂ් එය එකග වූ මිල වන රුපියල් මිලියන 7 කට මිලදී ගත් බවට තමුන් උපකල්පනය කරන බවයි. අවසානයේදී සුරේෂ් 2023.08.15 දින වෑන් රථය කුමාර් වෙත ආපසු භාර දෙන ලද්දේ, ඔහු නගරයෙන් පිටත සිටි බවට හේතු දක්වමිනි.කෙසේ වෙතත් වෑන් රථය සුරේෂ්ගේ සන්තකයේ තිබූ කාලයේ සුරේෂ් විසින් එය දීර්ඝ ගමන් වාරිකා සඳහා ලාභ ඉපයීමේ අරමුණින් විශාල වශයෙන් භාවිතා කොට තිබූ බව කුමාර් අනාවරණය කර ගත්තේය. දැන් කුමාර් වෑන් රථය භාර ගැනීම ප්‍රතික්ෂේප කරන අතර, ඒ වෙනුවට රුපියල් මිලියන 7 ක මුදලක් ඉල්ලා සිටී.

**(10 x2 = ලකුණු 20)**

02. ශ්‍රී ලංකාවේ 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනත වාණිජ ගණුදෙනු තුළදී මිල නොලත් විකුණුම්කරුවෙකු සතු අයිතීන් සහ ප්‍රතිකර්ම මූලිකව අවධාරණය කරයි. ඒ හා සමගාමීව එය ගැණුම්කරුවන්ට ඇති ප්‍රතිකර්ම දෙස යොමු කරන්නේ සාපේක්ෂව සීමිත අවධානයකි. තවදුරටත් ඇතැම් විචේචකයන් ඉස්මතු කරන්නේ වර්තමානය භාවිතය තුළ එකී ප්‍රතිකර්ම එතරම් සාධනීය නොවීමට ඉඩ ඇති බවයි.

ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නේද?

අදාළ ව්‍යවස්තාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීරණ මගින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

( ලකුණු 20)

----------- හිමිකම් ඇවිරිණි--------------